ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට මාධ්‍යවේදීන් සැලකිලිමත් විය යුතුය යනුවෙන් මාධ්‍ය ආචාර ධර්මයන්හි දැක්වේ. එහිදී සැලකිල්ලට ගත යුතු වන්නේ යම් අයෙකුට නැරඹීමට අපහසු තරමේ ලේ වැකි, සංවේදී ඡායාරූපයක් පළ කිරීම පුවත් වාර්තාවට කෙතරම් අත්‍යාවශ්‍යද යන්නයි.

මීට උදාහරණ ලෙසින් අලවංගුවකින් පහර දී පුද්ගලයෙකු මරා දැමූ පුවතක් වාර්තා කිරීමේදී දිවයින සහ අරුණ පුවත්පත් (08/25) ඒ සමගින් ඉදිරිපත් කර තිබෙන මියගිය පුද්ගලයාගේ ලේ වැකි ඡායාරූපය පෙන්වා දිය හැක.

මෙවැනි නැරඹීමට අපහසු තරමේ සංවේදී ඡායාරූපයක් පළ නොකිරීම මගින් ලිපියේ අන්තර්ගතයට හෝ ඉන් ඉදිරිපත් කරනා කාරණයට හානියක් වේද? එසේ හානියක් නොවන්නේ නම්, මෙවැනි සංවේදී ඡායාරූපයක් මෙම ලිපිය හා පළ කිරීම අවශ්‍යද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Aruna**